කොවිඩ් ව්‍යාප්තිය

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ අද් අව එකොළොස්වක ලත් කිවි දින | කාණ්ඩය 111 | පත්‍රය 307 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 දෙසැම්බර් 11 සිකුරාදා

දේශවංශය

ඉන්දු ලංකා මිත්‍රත්වයට ඉන්දිරාගෙන් අමුතු තෑග්ගක්

අද පත්‍රය සමඟ

අය - වැය සහන වහාම ක්‍රියාත්මකයි

- සූර්ය බල විදුලියට ණය සහන
- ව්‍යාපාර නංවන්න කාරක ප්‍රාග්ධන ණය
- තරුණ ව්‍යවසායකයන්ට මූල්‍ය පහසුකම්
- දේශීය කිරි ගොවීන්ට දිරිගැන්වීම් පිට 6

පොල්ගස්දූව ආරණ්‍යයේ වැඩ විසූ විදෙස් හිමිනමගේ අපවත් වීම ඝාතනයක්

ඝාතකයන් සොයා අගමැති උපදෙසින් මෙහෙයුම්

සිරුරු කොටස් රස පරීක්ෂකට

රුවන්ත තිතුල්ගස්විටිය

රත්ගම, කටුදම්පේ, පොල්ගස්දූව ආරණ්‍ය සේනාසනයේ භාවනානුයෝගීව වැඩ විසූ නෙදර්ලන්ත ජාතික ජිනවංස හිමියන්ගේ හදිසි මරණය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ කණ්ඩායමක් ඇතුළු පොලිස් කණ්ඩායම් හතරක් පුළුල් විමර්ශනයක් ආරම්භ කර තිබේ. පිට 06

පිට 6

ප්‍රතිදේහජනක පරීක්ෂණවලට පෞද්ගලික අංශයටත් ඉඩ

යුද හමුදාපති

අ...

පක්...

2020...

කොරෝනා පැණිය ...

ඡායාරූපය - කෑගල්ල දිස්ත්‍රික් සමූහ දයාරත්න ඔණ්ඩාර

මහින්ද අලුත්ගෙදර සහ සන්ධ්‍යා කරුණාරත්න

කෑගල්ලේ ධම්මික බණ්ඩාර මහතා නිෂ්පාදනය කළ කොරෝනා වයිරසයට එරෙහි දේශීය ඖෂධය කථානායකවරයාට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසකට පාර්ලිමේන්තුවේදී ඊයේ (10) පිරිනමා තිබේ.

ඊයේ (10) පස්වරුවේ පාර්ලිමේන්තු සංකීර්ණය වෙත පැමිණි ඒ මහතා එම පැණිය පිරිනැමූ අතර කථානායකවරයා ඇතුළු මන්ත්‍රීවරු එම අවස්ථාවේදීම එය පානය කළහ.

පිට 06

...දෙස මානුෂීයව බලා අඩුපාඩු කඩිනමින් විසඳන්න

ජනපතිගෙන් බලධාරීන්ට උපදෙස්

මහින්ද අලුත්ගෙදර

සිරකරුවන් දෙස මානුෂීයව අවධානය යොමු කරමින් පවතින අඩුපාඩු විසඳා අවශ්‍ය පහසුකම් සැලසීමට කඩිනම් පියවර ගන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අදාළ බලධාරීන්ට ඊයේ (10) උපදෙස් දුන්නේය.

මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවීම හේතුවෙන් 12,000කට අධික පිරිසක් සිරගතව සිටින අතර ඔවුන් කෙරෙහි විශේෂ අවධානය යොමු කර පුනරුත්ථාපන වැඩසටහනක් සකස් කිරීමේ අවශ්‍යතාවද ඒ මහතා පෙන්වා දෙයි. පිට 06

ජම්යතුල් උලමා ජනපති කොමිසමට වටලප්පන් ගෙනෙයි පිට 6

'රේඩියෝ ගුරුවරයා'

සා.පෙළ විද්‍යාව ප්‍රශ්න පත්‍ර හෙට 'දිනමිණ' සමඟ

වසර 26ක් දඬුවම් විඳින දේශපාලන සිරකරුවන්ට නිදහස දෙන්න

දෙමළ මන්ත්‍රීවරු ජනපතිට ලියති

නුවන් හෙට්ටිආරච්චි

අවුරුදු 26ක් තිස්සේ දේශපාලන සිරකරුවන් ලෙස සිරගත කොට සිටින දෙමළ ජාතිකයන් 80කට අධික පිරිසක් නිදහස් කරන ලෙස ඉල්ලමින් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලු දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අත්සනින් යුතුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ලිපියක් යොමු කර තිබේ. පිට 06

පිට 6

හිජාස් හිස්බුල්ලාගේ පෙත්සම විභාගයෙන් සභාපති විනිසුරු ඉවත් වෙයි

වික්ටෝරියා ජලාශය අවට භූ කම්පන පිළිබඳ සෙවීමට කමිටුවක්

සමගි ජන බලවේගයේ ව්‍යවස්ථාව සම්මත කිරීම 19 දා

මෙරට එන ශ්‍රමිකයන්ගේ නිවෙස් නිරෝධායනය ඉවත් කිරීමට සැලසුම් පිට 6

පාර්ලිමේන්තුවේ බයිබලයක් තිබේ නම් පෙන්වන්න පිට 6

ජොන්ස්ටන් විපක්ෂයට අභියෝග කරයි

සෞඛ්‍ය නීති කැඩූ බස් රථ 16ක බලපත්‍ර අත්හිටුවයි

පිට 6

තල් අරණ යට කොට කොළොම් තොට උඩ පනියි

එවන්ස් පන්දු 65කදී හතරේ 9යි. හයේ 5යි. නොදැවී ලකුණු 108යි

කලම්බු කිංග්ස් - 173/4 (20)
ලෝරි එවන්ස් නොදැවී 108, ඇන්ඩ්‍රි රසල් 21
ජැෆ්නා ස්ටැලියන්ස් - 167/6 (20) චරිත් අසලංක 32, ශොයිබ් මලික් 29 (ඇන්ඩ්‍රි රසල් 46/3)

අද තරගය

දඹුල්ල වයිකින් - කලම්බු කිංග්ස් (රාත්‍රී 8.00)

ඇනෙලා ගේ කාටූන